# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/22 – 2016 මැයි 11 වැනි බදාදා – 2016.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, වැඩ බලන ඉඩම් අමාත්‍ය විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සහා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො/කො11/ඩීඑස්ඕ/98/80 ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.5828ක් පමණ වන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබල්ලට මායිම්:

01. කැබලි අංක 02 – ආරච්චිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.5828ක් පමණ

උතුරට: කොළොන්නාව ඇළ; නැගෙනහිරට: කොළොන්නාව ඇළ සහ ඇඩ්වින් විතාන හිමිකම් කියන ආරච්චිය කුඹුර; දකුණට: පී. ඒ. විල්සන්, ඩල්සි බොතේජු සහ තවත් අය හිමිකම් කියන ආරච්චිය කුඹුර සහ කැබලි අංක 2; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ආරච්චිය කුඹුර.

ටී. බී. ඒකනායක,
ඉඩම් අමාත්‍ය. (වැ.බ.)

මගේ යොමු අංකය: එල්/03ජේ/94/එල්ආර්බී/160.
2015 දෙසැම්බර් මස 30 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 849


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*